# අස්පර්ශනීය උරුමයක් වන පුස්කොළපොත් සංරක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන් සතු අවබෝධය

## (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරවිද්‍යා අධ්‍යනාංශයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන් ඇසුරින්)

එල්. ඩී. මයූර ප්‍රේමරත්න[1], එන්. එම්. පී. නෙත්තසිංහ[2], මේනකා නිශාන්ති[3]

මුඛ්‍යපදඃ ජාතික උරුමය, ලියවිලි, පැරණි ලේඛන, පුරාවිද්‍යාව, සංරක්ෂණය

### හැඳින්වීම

විජයාවතරණයට පෙර සිටම ශ්‍රී ලංකාවේ සමාජ, සංස්කෘතික හා ආර්ථික අංශයන් දියුණුව පැවති බවත් ඒ හා සම්බන්ධ තොරතුරු කිසියම් සන්නිවේදන මාධ්‍යයක් ඔස්සේ භාවිතා කළ බවත් මහාවංශය පෙන්වා දෙන අතර අක්ෂර කලාවේ විකාශනය අධ්‍යයනය කිරීමේ දී ද ඒ බව මනා ලෙස පැහැදිලි වේ. කෙසේ වෙතත් ලේඛන කලාව තුළ සුවිශේෂී වූ ස්ථානයක් සනිටුහන් වන්නේ වළගම්බා රජු දවස භාණක පරම්පරාවෙන් සුරක්ෂිතව පවත්වාගෙන ආ ත්‍රිපිටකය මාතලේ අලුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟ ය (ම.ව,33.පරි,102-103). විහාරාරාම තුළ වූ පොත්ගුල පෝෂණය වූයේ රාජ්‍ය අනුග්‍රහය ලබමින් නිසා එය ආරක්ෂිතව ලේඛන කලාව ව්‍යාප්ත වීමට ඉවහල් විය. ලේඛන කලාවේ ස්වර්ණත ම යුගය කෝට්ටේ යුගය වූ අතර එහි විසූ පඬිවරුන්ගෙන් ලද සේවය ද ඉතා විශිෂ්ට ය. මේ යුගයේ දී නව ග්‍රන්ථ සමූහයක් රචනා කර ඇති අතර පැරණි පොත් පත් විශාල සංඛ්‍යාවක් පිටපත් කර තිබේ. ඒ අතර ආගමික කෘති, භාෂා සාහිත්‍ය, වෛද්‍ය ශාස්ත්‍රය, පශු චිකිත්සාව, ජෝතිශය ශාස්ත්‍රය, යන්ත්‍ර මන්ත්‍ර, ප්‍රබන්ධ, සිරිත් විරිත් හා උත්සව, නීතිය, කඩයිම් පොත්, විත්ති පොත්, ඉතිහාසය, බදු හා ආදායම්, කෘෂිකර්මය, රාජ්‍ය පාලනය, බෞද්ධ අධ්‍යාපනය, ලෝක විස්තර, සංගීතය හා කලාව ශිල්ප ආදී විවිධ විෂයන්ට අයත් පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් රචනා කර ඇත (ලගමුව, 2006, පි.84).

[1] ප්‍රධාන පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.
rajapelapatha.prem@gmail.com,

[2] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.
neththasinghe@sjp.ac.lk

[3] ප්‍රධාන පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.
nishanthi@sjp.ac.lk[3],

මෙ අකාරයෙන් රචිත පුස්කොළ පොත් ලේඛන කලාව හායනයන්ට හා විනාශයන්ට ලක් වීමට ඉඩ නොදී ආරක්ෂණ ක්‍රමවේදයන් යටතේ පවත්වා ගෙන යාම එහි පැවැත්මට සුවිශේෂී ලෙස ඉවහල් වේ. එම තත්ත්වය යටතේ වර්තමානයේ විනාශයට පත් වෙමින් පවතින මෙම උරුමය රැක ගැනීම වැදගත් වේ.

අරමුණු

- ඉතිහාසය හා පුරාවිද්‍යාව ඉගෙන ගන්නා විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් තුළ පවතින සංරක්ෂණය පිළිබඳ අවබෝධය විමසීම, පුස්කොළ පොත් සංරක්ෂණය හා එම ක්ෂේත්‍ර වෙත ඔවුන් යොමු කිරීම,අස්පර්ශනීය උරුමයන් රැකගැනීමේ අවශ්‍යයතාවය පෙන්වාදීම.

- පුස්කොළ පොත් සංරක්ෂණය විෂයක් ලෙස හා එම ආයතන පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි අපේක්ෂකයන් ඉගෙනීමේ වැදගත්කම පෙන්වාදීම.

පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පර්යේෂණ කටයුතු වල නියැලෙන විද්‍යාර්ථීන් විසින් මේ කෙරෙහි යොමු කර තිබෙන අවධානය හා ඔවුන් සතු සංරක්ෂණ දැනුමක් පවතී ද යන්න පිළිබඳ විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව විය.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම පරීක්ෂණය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ ඉගෙනුම ලබන සිසුන් අතරින් වසර හතරම නියෝජනය වන පරිදි පූර්ණ සංගහනයෙන් 33% ප්‍රතිශතයික නියදියක් තෝරාගත් අතර ඔවුන්ගෙන් අහඹු ලෙස තෝරාගත් අය සඳහා ප්‍රශ්නාවලියක් බෙදා දීම මගින් දත්ත රැස් කර ගන්නා ලදී. ඊට අමතරව ප්‍රාථමික, ද්විතීක හා තෘතීය මූලාශ්‍ර ද මේ සඳහා උපයෝගීකර ගන්නා ලදී.

සාකච්ඡාව

පර්යේෂණයේ දී අනාවරණය වූ තොරතුරු අතර දත්තදායකයන්ගේ සංරක්ෂණ දැනුම පිළිබඳ වූ සාමාන්‍ය අවබෝධය විමසීමේ දී රැකගත යුතු උරුමයක් වශයෙන් පුස්කොළ පොත්වල තිබෙන ජාතික වටිනාකම හා එම අවබෝධය සියලුම වසරවල සිසුන්ගේ ධනාත්මකව ඉහළ තත්ත්වයක පවතී. දෙවන, තෙවන හා සිව්වන වසර වල සිසුන්ගේ එකඟතාවය 100%ම වන අතර ප්‍රථම වසරේ පමණක් අවබෝධයක් නැත යනුවෙන් 3.75% ක පිරිසක් (පුරාවිද්‍යාව) ප්‍රකාශ කර තිබේ.සංරක්ෂණය පිළිබඳ විද්‍යාර්ථීන් සතු මූලික අවබෝධය විමසීමට

ලක් කිරීමේ දී ප්‍රථම වසරට වඩා අනෙකුත් වසරවල සිසුන් සතු අවබෝධය ඉහළ මට්ටමක පවතී. දෙවන වසරේ පුරාවිද්‍යාව විෂය හදාරන සිසුන් 14.28% ද ඉතිහාසය විෂය හදාරන සිසුන් 15.38% ද සාමාන්‍ය හෝ සංරක්ෂණ අවබෝධයක් රහිත සිසුන් වේ. එම තත්ත්වය තෙවන හා සිව්වන වසරවල දී 100% අවබෝධයකින් පසු වන බව පැහැදිලි විය.ශ්‍රී ලංකාව තුළ පුස්කොළ පොත් සංරක්ෂණය සඳහා මැදිහත් වන ආයතන හා ඒ පිළිබඳ විද්‍යාර්ථීන් සතු දැනුම කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ප්‍රථම වසර සිසුන්ගේ දැනුවත් භාවය ඉතාමත් අඩු තත්ත්වයක විය. එය පිළිවෙලින් පුරාවිද්‍යාව සිසුන් 70% ද ඉතිහාසය සිසුන් 46% ද දැනුවත් බවක් නොමැති සිසුන් අතර විය. ප්‍රථම වසර සිසුන්ගේ ප්‍රතිශත අගයන් කෙරෙහි අවධානය යොමු කිරීමේ දී පුස්කොළ පොත් සංරක්ෂණ ආයතන පිළිබඳ ඔවුන්ගේ දැනුවත් බව අඩු අතර සිව්වන වසර ඉතිහාසය සිසුන්ගේ ද එලෙස ම වේ.

**සමාලෝචනය**

ඒ අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සිසුන්ගේ දත්තයන්ට අනුව ප්‍රථම වසර හා දෙවන වසර සිසුන්ට වඩා තෙවන හා සිව්වන වසරවල සිසුන්ගේ පුස්කොළ පොත් පිළිබඳ පවතින අවබෝධය වැඩි බවත් ඒ සඳහා අධ්‍යයනාංශය තුළ පුස්කොළ පොත් සංරක්ෂණය පිළිබඳ දැනුම ලබා දීම හේතු වී තිබෙන බවත් නිගමනය විය. ප්‍රථම වසර හා දෙවන වසර සිසුන්ගේ අවබෝධය අඩු වීමට හේතු වී ඇත්තේ එම දැනුම ලබා දීම සිදු වන්නේ තෙවන වසරේ දී වීමය.

**යෝජනා**

- විශ්වවිද්‍යාල සිසුන්හට පුස්කොළ පොත් වල දේශීය වශයෙන් ඇති වැදගත්කම දැනුවත් කිරීම සඳහා වැඩසටහන් සංවිධානය , ජාතික හා අන්තර්ජාතික පර්යේෂණ සැසි වැඩමුළු දියත් කිරීම.

- පාසල් සිසුන් දැනුවත් කිරීමේ ප්‍රචාරණ කණ්ඩායම් බිහි කිරීම, ඒ සඳහා මෙම මානව සම්පත් උපයෝගී කර ගැනීම.

- පුස්කොළ පොත් සංරක්ෂණ ආයතන සඳහා පුරාවිද්‍යා විශේෂවේදී සිසුන් ඇතුළත් කර ගැනීම හා ඔවුන් තවදුරටත් එම ක්ෂේත්‍රයේ පරිණතයන් බවට ප්‍රායෝගිකව පත් කිරීම.

## විමර්ශිත ග්‍රන්ථ

ලගමුව, ඒ., (2006), ශ්‍රී ලංකාවෙ පුස්කොළපොත් ලේඛන කලාව, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, බත්තරමුල්ල.

සුමංගල, එච්. සහ බටුවන්තුඩාවේ, පී., (2015), මහාවංශය සිංහල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

අග්‍රවාල්, ඕ. පී., (2004), කෞතුක වස්තු සංරක්ෂණ මූලධර්ම, (එස්. ලක්දුසිංහ, පරි.), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.